සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2021 ජූලි

## (303) මූල්‍ය පාලනයන් සහ විගණනය

(Financial Controls & Audit)

2021-10-23
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 08
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
    *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*
  - (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  - (6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (7) *ලකුණු 100.*

---

## A කොටස

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

සහතිකවීමේ කාර්යභාරයක අරමුණ වන්නේ තොරතුරුවල අපේක්ෂිත පරිශීලකයන්ට සහතිකවීමක් ලබාදීම වේ. සාධාරණ සහතිකවීමේ කාර්යභාරයන් (reasonable assurance engagements) සහ සීමිත සහතිකවීමේ කාර්යභාරයන් (limited assurance engagements) යනුවෙන් සහතිකවීමේ කාර්යභාර වර්ග දෙකක් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සාධාරණ සහතිකවීමේ කාර්යභාරයක් සහ සීමිත සහතිකවීමේ කාර්යභාරයක් අතර ඇති වෙනස්කම් තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(b) ව්‍යාවස්ථාපිත විගණනය හැරුනු විට, සහතිකවීමේ කාර්යභාරයන් සඳහා උදාහරණ දෙකක්(02) **සඳහන් කරන්න.**
(ලකුණු 02)
(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

නියෝජ්‍යත්ව න්‍යායට (agency theory) අනුව කොටස්කරුවන්ගේ හිමිකම ආරක්ෂාවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සභාපතිගේ සහ ප්‍රධාන විධායක නිළධාරිගේ භූමිකාවන්ගේ බලතල වෙන්කළ යුතු වීම අවශ්‍ය වන අතර, භාරකාරත්ව න්‍යායට (stewardship theory) අනුව මෙම භූමිකාවන්හි බලතලවල හවුල් ක්‍රියාකාරීත්වය මගින් කොටස්හිමියන්ගේ හිමිකම උපරිම කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

නියෝජ්‍යත්ව න්‍යාය සහ භාරකාරත්ව න්‍යාය අතර වෙනස **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

## **03** වන ප්‍රශ්නය

**සීමාසහිත AB පොදු සමාගම,** විනෝද සේවා අංශයේ (leisure sector) මෙහෙයුම් සිදුකරන සමාගමක් වන අතර, කොවිඩ්-19 (COVID-19) වසංගත තත්ත්වය හේතුකොටගෙන එම සමාගමට එහි මෙහෙයුම් කටයුතුවලදී දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදුව ඇත. සමාගම විසින් ස්ථාපිත කර ඇති අවදානම් කළමනාකරණ රාමුව (framework) මගින් හඳුනාගත් අවදානම්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

| **ප්‍රධාන අවදානම්** | **අවදානම් ශ්‍රේණිගතකරණය** |
|---|---|
| සාර්ව ආර්ථික සහ දේශපාලන පරිසරය | වැඩි |
| නියාමන පරිසරය | වැඩි |
| තොරතුරු තාක්ෂණය | වැඩි |
| තරඟකාරිත්වය | අඩු |
| මානව සම්පත් කළමනාකරණය | අඩු |
| පාරිසරික සහ සෞඛ්‍ය හා ආරක්ෂාව | වැඩි |
| කීර්තිනාමය සහ සන්නම් නාමය | අඩු |

**ඔබ විසින් කළ යුතු දෑ:**

විනෝද සේවා අංශයේ මෙහෙයුම් සිදුකරන සමාගමක් ලෙස, **සීමාසහිත AB පොදු සමාගමේ** පහත සඳහන් අවදානම් **තක්සේරු කරන්න**:

(a) මෙහෙයුම් අවදානම.

(b) අනුකූලවීමේ අවදානම. (ලකුණු 05)

## **04** වන ප්‍රශ්නය

ආයතනය, සිය ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි තුළින් කාර්යභාර කාර්යසාධනයේ ගුණාත්මකභාවය පිළිබඳ ඒකීයතාවය ප්‍රවර්ධනය කරනු ලබන අතර, කාර්යභාර හවුල්කරු විසින් එක් එක් කාර්යභාරයේ තත්ත්ව පාලනය පිළිබඳව අවසන් වගකීම දරණු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) කාර්යභාර කාර්යසාධනයේ ගුණාත්මකභාවයේ ඒකීයතාවය (consistency) පවත්වා ගැනීම සඳහා අවධානය යොමුකළ යුතු කරුණු දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) විගණන වැඩ සමාලෝචනය (reviewing) කිරීමේදී සළකා බැලිය යුතු කරුණු තුනක්(03) **සඳහන් කරන්න**.

(ලකුණු 03)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

# <u>B කොටස</u>

(මුළු ලකුණු 30)

## **05** වන ප්‍රශ්නය

ඔබ, **සුරාජ්** සහ **අනිල්** යන දෙදෙනා හවුල්කාරිත්වය දරණ වරලත් ගණකාධිකාරිවරුන්ගේ විගණන ආයතනයක් වන **සුරාජ් සහ සමාගමේ** විගණන ජ්‍යෙෂ්ඨයෙක් වේ. ඔබ ආයතනය පසුගිය වසර 25 පුරාවට **සීමාසහිත ෆෙන් ට්‍රේඩිං (පෞද්ගලික) සමාගමේ (FTL)** හි විගණකවරයා වන අතර, පසුගිය වසර 6 ක කාලය පුරාවට ඔබ, මෙම සමාගමේ විගණනයට සම්බන්ධ වී සිටී. **FTL** සමාගමේ කළමනාකරණ අධ්‍යක්ෂවරයා විසින් සමාගමේ රිදී ජුබිලිය සැමරීම වෙනුවෙන් විගණන කාර්ය මණ්ඩලයේ සියලු දෙනා සඳහා තෑගි වවුචර්පත් සහ තරු 5 හෝටලයක දින දෙකක් ගත කිරීමට අනුග්‍රහය දක්වන ලදී.

සමාගමේ ප්‍රාග්ධන පදනම ඉහළ නැංවීම සඳහා ලබන වසරේදී සැළසුම්කොට ඇති පෞද්ගලික කොටස් නිකුතුව පිළිබඳ FTL සමාගමේ කළමනාකරණ අධ්‍යක්ෂක විසින් රිදී ජුබිලි උත්සවය අතරවාරයේදී හෙළිදරව් කළ අතර, මේ සඳහා සුදුසු ආයෝජකයෙකු සොයා දීම සඳහා ඔබේ විගණන කළමනාකරු එකඟ විය. තම සමාගමේ ආයෝජනය සඳහා සුදුසු ආයෝජකයෙකු සොයාගැනීම සම්බන්ධව **සුරාජ් සහ සමාගම** සාර්ථක වන්නේ නම්, විගණන ගාස්තුව 20% කින් වැඩිකරන බව කළමනාකරණ අධ්‍යක්ෂකවරයා දැනුම් දෙන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සිද්ධිය සම්බන්ධයෙන් ආචාරධර්මවල මූලික මූලධර්මයන්ට අනුකූලවීමේ තර්ජන (threats to compliance) තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) ඉහත (a) තුළින් හඳුනාගත් තර්ජන අවමකිරීම සඳහා **සුරාජ් සහ සමාගම** විසින් ආයතනික මට්ටමින් ගතයුතු ආරක්ෂාවන් (firmwide safeguards) හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## **06** වන ප්‍රශ්නය

නව විගණන සේවාදායකයෙක් වන **සීමාසහිත රෝයි හොටෙල්ස් (පෞද්ගලික) සමාගමේ (RHL)** විගණනය සඳහා **විමල්ව** පළමුවරට විගණන කළමනාකරුවෙකු ලෙස පත්කරනු ලැබීය. **RHL** හි 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් කිසිවක් මේ වන තුරු සිදුකොට නොමැති බවත් එම විගණන කටයුතු ලබන මාසය තුළ ආරම්භ කළ යුතු බවත් විගණනය භාර හවුල්කරු වන **සිවා** සඳහන් කරන ලදී. විශේෂයෙන් මූලික විගණනයට අදාල මූලික කාර්යභාර ක්‍රියාකාරකම් සඳහා සහාය වන ලෙස **සිවා** විසින් දැනුම් දෙන ලදී. විගණන ලිපි ලේඛණ විගණන මෘදුකාංගයට ඇතුළත් කළයුතු බවත් විගණන සහායකයින් දෙදෙනා විසින් සම්පූර්ණ කරන ලද විගණන වැඩ පත්‍රිකා (working papers) සමාලෝචනය කළ යුතු බවත් **සිවා** විසින් තවදුරටත් දැනුම් දෙන ලදී. **විමල්** විසින් විගණන ලේඛණගතකරණය සම්බන්ධයෙන් ඔහුගේ සහායකයින් දෙදෙනා සමඟ සාකච්ඡා කිරීමට සැළසුම් කරමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) විගණනය ආරම්භ කිරීමට ප්‍රථමයෙන් ඉහත මූලික විගණනය සම්බන්ධයෙන් **විමල්** විසින් ඉටුකළ යුතු නිශ්චිත ක්‍රියා පටිපාටි දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) විගණන ලේඛණගතකරණයේ (Audit Documentation) මූලික අරමුණ **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(c) විගණන ලේඛණගතකරණයේ ඇතුළත් වැඩ පත්‍රිකා තුළ ඇතුළත් වන තොරතුරු තුනක්(03) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## **07** වන ප්‍රශ්නය

වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයක් වන **සේන සහ සමාගම,** 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත රාමා පොදු සමාගමේ** විගණකවරයා වන අතර, සමාගමේ බදු පෙර ලාභය මත නිශ්චය කරන ලද ප්‍රමාණාත්මක මට්ටම රු.900,000/- කි.

විගණන ලියකියවිලිවලින් පහත සඳහන් තොරතුරු උපුටාගත්තා ලදී:

**සොයාගැනීම්:**

(1) වර්ෂය තුළදී සමාගම විසින් විශේෂිත බැංකු ණය මුදලක් ලබාගෙන කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම ආරම්භ කරන ලදී. වර්ෂය තුළදී මෙම ණයමුදල සඳහා දැරූ සම්පූර්ණ ණය පොලිය රු. මිලියන 5 ක් වූ අතර, එය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය වියදම් යටතේ වාර්තාකර තිබුණි. ගොඩනැගිල්ලේ ඉදිකිරීම 2021 දෙසැම්බර් මස අවසන් කිරීමට නියමිත අතර, මෙම ඉදිකිරීම මත වර්ෂය තුළ දැරූ පිරිවැය රු. මිලියන 65 කි.

(2) 2020 සැප්තැම්බර් සිට 2021 පෙබරවාරි මාස දක්වා පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශන සමාගමේ ගණකාධිකාරී විසින් සමාලෝචනය කර නොතිබුණි.

(3) වර්ෂය තුළදී, මානව සම්පත් විධායක විසින් පිළියෙල කරන ලද මාසික වැටුප් සාරාංශය, මානව සම්පත් කළමනාකරු විසින් සමාලෝචනය කර නොතිබුණි.

(4) ඉහත අංක (2) හි සඳහන් සොයාගැනීම, පසුගිය වර්ෂයේ විගණනයේ සොයා ගැනීමක් ලෙස ද වාර්තාකොට තිබුණි.

**සන්නිවේදනය:**

විගණන කළමනාකරු විසින් ඉහත සඳහන් සොයාගැනීම්, **සීමාසහිත රාමා පොදු සමාගමේ** සහකාර ගණකාධිකාරී වෙත දැනුම් දී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සිදුවීම්වලට අදාලව සපයා ඇති තොරතුරුවලට අනුව විගණක විසින් කළමනාකාරීත්වයට සහ පාලනය භාරව සිටින පාර්ශවයන් සමඟ සන්නිවේදනය කළ යුතු කරුණු දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මත විගණන වාර්තාවේ විගණන මතය කෙරෙහි ඉහත අංක (1) හි සඳහන් කරුණුවල බලපෑම (impact) **තක්සේරු කරන්න.** (ලකුණු 06)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 50)

### 08 වන ප්‍රශ්නය

**සීමාසහිත මාලක (පෞද්ගලික) සමාගම,** යුරෝපීය වෙළෙඳපොළ සඳහා ඇඟළුම් නිපදවන කර්මාන්තශාලා සේවකයින් 200 ක ගෙන් සමන්විත පවුලේ ව්‍යාපාරයකි. පහත සඳහන් තොරතුරු සමාගමේ වැටුප් ලේඛණය හා සම්බන්ධ ක්‍රියාවලි අධ්‍යයනයේදී හෙළිදරව් විය:

(1) මානව සම්පත් දෙපාර්තමේන්තුව, මානව සම්පත් කළමනාකරු සහ මානව සම්පත් සහායකගෙන් සමන්විත වන අතර, මුල්‍ය දෙපාර්තමේන්තුව, ගණකාධිකාරීවරයෙකුගෙන් සහ ගිණුම් විධායෙකුගෙන් සමන්විත වේ.

(2) සේවකයන්ගේ පැමිණීම, දොරටුවේ තබා ඇති පොතක සටහන් කරනු ලැබේ.

(3) පැමිණීම සටහන් කරන පොතෙහි ඇති තොරතුරු මත පදනම්ව මානව සම්පත් සහායක විසින් මාසික වැටුප් ලේඛණය පිළියෙළ කරනු ලැබේ.

(4) වැටුප් ලේඛණයට සිදුකරන සියලුම සංශෝධනයන් මානව සම්පත් සහායක විසින් සිදුකරනු ලැබේ.

(5) සේවකයින්ගේ වෙන් වෙන් බැංකු ගිණුම්වලට වැටුප් ගෙවීම සිදුකරනු ලබන අතර, වැටුප් මාරු කිරීමට අදාල උපදෙස් ගිණුම් විධායක විසින් පිළියෙල කරනු ලබන අතර, එය අධ්‍යක්ෂකවරයා විසින් අනුමත කරනු ලබයි.

(6) වැටුප් වාර්තා සියල්ල මුල්‍ය දෙපාර්තමේන්තුවේ පොදු ස්ථානයක තබා ඇත.

(7) කර්මාන්තශාලාවේ නිෂ්පාදන පේළි (production lines) 5 ක් ස්ථාපිත කර ඇති අතර, සෑම පේළියක්ම අධීක්ෂණය කරනු ලබන්නේ කර්මාන්තශාලා අධීක්ෂක විසින් වන අතර ඔහු කර්මාන්තශාලාවට ඇතුළුවීම්, කර්මාන්තශාලාවෙන් පිටවීම් සහ එක් එක් සේවකයා විසින් නිෂ්පාදනය කරනු ලබන නිමැවුම වැනි කර්මාන්තශාලාවේ වැඩ කාල සටහන් (job schedules) පවත්වාගෙන යනු ලැබේ.

(8) අධ්‍යක්ෂක විසින් වැඩ කාල සටහන් සමඟ වැටුප් ගෙවීම් සාරාංශයේ සිටින සේවකයින් ගණන සමාලෝචනය කරනු ලැබේ.

(9) ගිණුම් විධායක විසින් වැටුප් ලේඛණයට අදාල සියලු ගිණුම්කරණ සටහන් ලෙජර් ගිණුම්වලට පිටපත් කරනු ලැබේ.

(10) වර්ෂය තුළදී, සමාගම විසින් ලෙජර් ගිණුම් ඇතුලත් මොඩියුලයට වෙනස්කම් සිදුකරන ලද අතර, මෙම වෙනස්කම් සිදුකරන ලද්දේ ගිණුම් විධායක විසින්ය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත මාලක (පෞද්ගලික) සමාගමේ** නිසිපරිදි සැලසුම් කර නොමැති පාලන ක්‍රියාකරකම්හි මූලිකාංග (elements) තුනක්(03) එක් එක් අභ්‍යන්තර පාලන දුර්වලතාවයට උදාහරණයක් ද සහිතව **හඳුනා ගන්න**. (ලකුණු 06)

(b) ඉහත සඳහන් වැටුප් ක්‍රියාවලියේ පවතින දුර්වලතා මගහරවා ගැනීම සඳහා නිර්දේශ (recommendations) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(c) ආයතනයක් තුළ අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිලාභ (benefits) තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(d) වැටුප් පද්ධතියක වැටුප් ක්‍රියාවලියේ පියවර (steps) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(e) පරිගණක වැඩසටහන්වල අනවසර වෙනස්කිරීම් වැළැක්වීම හෝ හඳුනාගැනීම සඳහා ස්ථාපිත කළ හැකි පාලනයන් හතරක්(04) සහ දත්ත ගොනුවලට අනවසර සංශෝධන වැළැක්වීම සඳහා ස්ථාපිත කළ හැකි පාලනයන් දෙකක්(02) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

ඔබ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයක් වන **DSK ඇසෝසියේට්ස්** ආයතනයේ ජ්‍යෙෂ්ඨ විගණක වේ. කොවිඩ්-19 (COVID-19) වසංගතයේ බලපෑම හේතුකොටගෙන විගණනය ඉටුකිරීමේදී ගමන්කිරීම් අවම කොට මාර්ගගත ක්‍රමය ඔස්සේ විගණන ක්‍රියාකාරකම්වල යෙදෙන ලෙස ඔබගේ විගණන කළමනාකරු විසින් උපදෙස් දී ඇත.

මසා නිමකළ ඇඳුම් මිළදී ගැනීමේ සහ තොග වෙළඳාමේ යෙදී සිටින ආයතනයක් වන **සීමාසහිත SM හෝල්ඩිං (පෞද්ගලික) සමාගමෙන්** ඔබ වෙත විද්‍යුත් තැපැලක් ලැබී ඇත. පහත සඳහන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ අදාල ලේඛණ එම විද්‍යුත් තැපෑලේ ඇමුණුම් ලෙස එවා තිබුණි:

(1) මූල්‍ය තත්ත්ව ප්‍රකාශන: *(රු.'000)*

| | **2021 මාර්තු 31 දිනට** | **2020 මාර්තු 31 දිනට** |
|---|---:|---:|
| දේපළ, පිරියත සහ උපකරණ, ධාරණ අගයට | 231,831 | 125,550 |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 84,340 | 20,660 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 102,571 | 60,390 |
| | **418,742** | **206,600** |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 80,000 | 80,000 |
| රඳවාගත් ඉපැයීම් | 39,410 | 24,210 |
| **ජංගම වගකීම්:** | | |
| බැංකු ණය | 141,390 | 55,410 |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 121,390 | 45,930 |
| වෙනත් ගෙවිය යුතු මුදල් | 36,552 | 1,050 |
| | **418,742** | **206,600** |

(2) දේපළ, පිරියත සහ උපකරණවලට අදාල තොරතුරු: *(රු.`000)*

| | **පිරිවැය** | **අත්පත් කර ගැනීම්/ (ඉවත් කිරීම්)** | **2021 මාර්තු 31 දිනට සමුච්චිත ක්ෂය** | **2021 මාර්තු 31 දිනට ශේෂය** |
|---|---:|---:|---:|---:|
| ඉඩම සහ ගොඩනැගිලි | 152,576 | 89,300 | 24,200 | 217,676 |
| මෝටර් වාහන | 18,980 | - | 4,825 | 14,155 |
| **එකතුව** | **171,556** | **89,300** | **29,025** | **231,831** |

(3) වෙළෙඳ ලැබිය යුතු මුදල් හි වයස් විශ්ලේෂණය: *(රු.`000)*

| **නම** | **එකතුව** | **දින 0-30** | **දින 30-60** | **දින 60-90** | **දින 90 ට වැඩි** |
|---|---:|---:|---:|---:|---:|
| ධනුෂ්ක ෆැෂන් | 26,831 | 2,855 | - | - | 23,976 |
| ශිරාන් ෆැෂන් | 41,325 | 14,610 | 14,550 | 12,165 | - |
| කමිල් ටෙක්ස්ටයිල් | 7,580 | 7,580 | - | - | - |
| SJ ගාමන්ට් | 4,011 | - | 4,011 | - | - |
| ලක්ෂ්මි ගාමන්ට් | 21,357 | 6,822 | (955) | 12,153 | 3,337 |
| සිතර්ජ් ටෙක්ස් | 1,467 | - | - | - | 1,467 |
| | **102,571** | **31,867** | **17,606** | **24,318** | **28,780** |

(4) ආදායම් ප්‍රකාශනයේ උද්ධෘතයන්: *(රු.`000)*

| මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2021 | 2020 |
|---|---|---|
| විකුණුම් | 175,300 | 164,210 |
| විකුණුම් පිරිවැය | (147,290) | (131,350) |
| **දළ ලාභය** | **28,010** | **32,860** |
| වියදම් | (12,810) | (11,700) |
| **බදු පෙර ශුද්ධ ලාභය** | **15,200** | **21,160** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) පසුගිය වර්ෂයේ විගණන වැඩ පත්‍රිකාවලට අනුව **ලක්ෂ්මී ගාමන්ට්ස් ආයතනය, සීමාසහිත SM හෝල්ඩිං (පෞද්ගලික) සමාගමේ** සම්බන්ධිත පාර්ශවයකි. එම ආයතනය, **සීමාසහිත SM හෝල්ඩිං (පෞද්ගලික) සමාගමේ** කළමනාකරණ අධ්‍යක්ෂවරයාගේ බිරිඳ වන **කුලරත්න මහත්මියට** අයිති වේ.

(2) සළකා බලන වර්ෂය සඳහා **සීමාසහිත SM හෝල්ඩිං (පෞද්ගලික) සමාගමේ** ගනුදෙනු සංඛ්‍යාව අඩු බැවින් සංඛ්‍යානමය නොවන නියැදි (non-statistical sample) ප්‍රවේශයක් ලබාගන්නා ලෙස කාර්යභාර හවුල්කරු විසින් ඔබ වෙත උපදෙස් ලබාදී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සඳහන් වාර්තාවලින් වැඩිදුර විගණන සාක්ෂි සහ විමසීම් සිදුකිරීමට අවශ්‍ය ක්ෂේත්‍ර (areas) පහක්(05) **හඳුනා දක්වන්න**. (ලකුණු 05)

(b) විගණන විමසීම් හැර විගණන සාක්ෂි ලබාගැනීම සඳහා භාවිත කළ හැකි විගණන ක්‍රියා පටිපාටි තුනක්(03) එක් එක් ක්‍රියා පටිපාටියට උදාහරණයක් සමඟ **සඳහන් කරන්න**. (ලකුණු 06)

(c) **සීමාසහිත SM හෝල්ඩිං (පෞද්ගලික) සමාගමේ,** දේපළ, පිරියත සහ උපකරණවලට අදාලව සිදුකළ යුතු විගණන ක්‍රියා පටිපාටි පහක්(05) **ලැයිස්තුගත කරන්න** (ලකුණු 05)

(d) **සීමාසහිත SM හෝල්ඩිං (පෞද්ගලික) සමාගමේ** සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගනුදෙනු විගනණයට අදාලව ඉටුකළ යුතු විගණන ක්‍රියා පටිපාටි පහක්(05) **සඳහන් කරන්න.** (ලකුණු 05)

(e) කරුණක් අවධාරණය කිරීමේ ඡේදයක් ඇතුලත් කිරීම අවශ්‍යයැයි විගණක විසින් සළකා බලනු ලබන අවස්ථාවන් සඳහා උදාහරණ දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# <u>කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව</u>

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැළකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනඟා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |